# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2465/09 - 2025 දෙසැම්බර් මස 02 වැනි අඟහරුවාදා - 2025.12.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත**

64(5) වන වගන්තිය යටතේ පුරප්පාඩුවක් පිරවීම

පිළිගත් දේශපාලන පක්ෂයක් වන සමගි ජන බලවේගය විසින් නාමයෝජනා කරන ලදුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද බව ප්‍රකාශයට පත් කරන ලද මුහම්මදු ඉස්මායිල් මුත්තු මුහම්මදු මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන දසවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව, 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතේ 6 වන වගන්තියෙන් සංශෝධිත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(5) වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇති හෙයින් ද,

එකී පුරප්පාඩුව පුරවනු පිණිස එකී දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් නියම කර ඇති හෙයින් ද,

ඉහත කී දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එම පුරප්පාඩුව පුරවනු පිණිස **නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා** නාමයෝජනා කර ඇති හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනව වැනි සංශෝධනයේ විධිවිධාන සමඟ කියවිය යුතු 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64 (5) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ඉහත කී මුහම්මදු ඉස්මායිල් මුත්තු මුහම්මදු මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා **නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා**

දසවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද බව මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ආර්.එම්.ඒ.එල් .රත්නායක**
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව

**එම්.ඒ.පී.සී.පෙරේරා**
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව

**අමීර් ෆායිස්**
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව

**ඒ. ෂන්මුගනාදන්**
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව

2025 දෙසැම්බර් මස 02 වන දින,
රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.

EOG 12 - 0009

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.